Alcohol and Drug
Information Centre

ADIC

No.40/18, Park Road, Colombo 05, Sri Lanka.
Tel: +94 11 2584416,+94 11 2592515, Fax: +94 112508484
Email: info@adicsrilanka.org
Web site: http//www.adicsrilanka.org

**මාධ්‍ය නිවේදනය**

**ලෝක දුම්වැටි නිවාරණ දිනය - 31.05.2025**

**"දුම්කොළ කර්මාන්තයේ උපක්‍රම හෙළිදරව් කරමු."**

දුම්කොළ කර්මාන්තයේ ආක්‍රමණශීලී උපක්‍රම වැඩි වැඩියෙන් තරුණයින් ඉලක්ක කර ගනිමින් සිටින අවස්ථාවක, මෙවර ලෝක දුම්වැටි නිවාරණ දින තේමාව වන්නේ "දුම්කොළ කර්මාන්තයේ උපක්‍රම හෙළිදරව් කරමු" යන්නයි. මෙම කූඨ උපක්‍රම පිළිබඳව හෙළිදරව් කිරීම සහ ඒවායේ බලපෑම පිළිබඳව දැනුවත් කිරීම මෙහි අරමුණයි.

දුම්වැටි භාවිතයෙන් දෛනිකව මරණයට පත් වන පාරිභෝගිකයන්ගේ අඩුව පිරිමසා ගැනීම සඳහා දුම්කොළ සමාගමේ විවිධ උපාය මාර්ග වල ප්‍රමුඛ ඉලක්කය බවට පත් වී ඇත්තේ ළමුන් සහ තරුණයන් ය. දුම්කොළ සහ නිකොටින් නිෂ්පාදනවල සැබෑ හානිය සඟවා තරුණ පිරිස අතර මෙම නිෂ්පාදනවල ආකර්ෂණය වැඩි කිරීමට මෙම උපක්‍රම භාවිතා වෙයි. මෙම උපාය මාර්ග තරුණයින් අතර දුම්කොළ භාවිතය සාමාන්‍යකරණය කිරීමට පමණක් නොව මහජන සෞඛ්‍ය ප්‍රතිපත්තිවලටද හානිදායක ලෙස බලපායි.

ශ්‍රී ලාංකික දරුවන් සහ තරුණ තරුණියන් දුම්වැටි භාවිතයට යොමු කිරීම සඳහා දැවැන්ත උපක්‍රම ගණනාවක් අප රට තුළ ද බහුජාතික දුම්කොළ සමාගම් මේ වන විටත් දියත් කරමින් සිටියි. ඉන් කිහිපයක් නම්;

- සමාජ මාධ්‍ය ජාල සහ පුවත්පත්, රූපවාහිනිය, ගුවන් විදුලිය හරහා දුම්වැටි භාවිතය ළමුන් සහ තරුණයන් අතර ආකර්ෂණීය භාණ්ඩයක් බවට පත්කිරීමට කටයුතු කිරීම
- දුම්පානය ආකර්ශනීය ලෙස නිරූපණය කිරීම සඳහා තරුණ තරුණියන් නිතර ගැවසෙන ස්ථාන සහ උත්සව අවස්ථා වල සිගරට් භාවිතා කිරීම සඳහා කුලියට මිනිසුන් යෙදවීම.
- විවිධ ඇසුරුම් සහ විවිධ රසයන්ගෙන් යුත් සිගරට් සහ විද්‍යුත් සිගරට් (e-cigarette) වැනි දුම්කොළ නිෂ්පාදන හඳුන්වා දීම.
- තරුණයන් සහ ළමුන් නිතර පැමිණෙන ස්ථානවල දුම්වැටි වෙළඳ දැන්වීම් සහ ඇසුරුම් ප්‍රදර්ශනය සහ "බාල වයස්කරුවන්ට විකිණීමට තහනම්" ආදී දැන්වීම් මඟින් දුම්වැටි පිළිබඳ කුතුහලයක් ඇති කිරීම වැනි උපක්‍රම හඳුන්වා දිය හැකියි.

වර්තමානයේ දුම්කොළ සමාගම්වල නිෂ්පාදන දිනෙන් දින ප්‍රතික්ෂේප වීම නිසා ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රතිනිර්මාණය කොට ඒ වටා පාරිභෝගිකයන් ගොඩනගා ගැනීම සඳහා විවිධ උත්සාහයන් දරමින් සිටියි. විද්‍යුත් සිගරට් යනු එම ව්‍යාපාරයේ එක් උපක්‍රමයක් වන අතර ඒවා "අවදානම් අඩු" සහ "හානිදායක බැවින් අඩු" ලෙස ප්‍රවර්ධනය කරයි. නමුත්, මෙම ප්‍රකාශ සඳහා විද්‍යාත්මක පදනමක් නොමැත. දුම්පානය නැවැත්වීමේ ආධාරකයක් ලෙස විද්‍යුත් සිගරට් ව්‍යාජ ලෙස සමාගම් අලෙවි කරන නමුත්, පර්යේෂණ වලින්

පෙනී යන්නේ විද්‍යුත් සිගරට් භාවිතා කරන පුද්ගලයින් බොහෝ විට "ද්විත්ව භාවිතය" ට පත්වී, සාම්ප්‍රදායික දුම්කොළ නිෂ්පාදන ද ඒ සමඟ භාවිතා කරන බව ය. එනිසා, දුම්කොළ කර්මාන්තය මෙම නිෂ්පාදන නිරූපණය කරන ආකාරය භයානක මෙන්ම රැවටිලිකාරී වේ.

දුම්කොළ භාවිතය ශ්‍රී ලංකාව තුළ සැලකිය යුතු සෞඛ්‍යමය, ආර්ථිකමය, සමාජීය සහ පාරිසරික ගැටලුවක් ලෙස පවතී. 2020 ගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණයට (Global Adult Tobacco Survey) අනුව, සමස්තයක් වශයෙන් 19.4% ක් (වැඩිහිටියන් මිලියන 3.2 ක්) දැනට දුම්කොළ භාවිතා කරති. සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ දුම්පානය කිරීමේ ප්‍රවණතාවය 9.1% ක් (වැඩිහිටියන් මිලියන 1.5 ක්) ලෙස වාර්තා විය. මෙමගින් දුම්පානය පහත වැටීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන අතර, එය වසර ගණනාවක් පුරා දුම්කොළ වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාව දක්වන කැපවීමේ ප්‍රතිඵලයකි. කෙසේ වෙතත්, දුම්වැටි නිසා වසරකට ශ්‍රී ලාංකිකයන් 20 000ක් පමණ අකාලයේ මරණයට පත් වන අතර, එය  රටේ සෞඛ්‍ය සේවා පද්ධතියට විශාල බරක් පැටවීම මෙන්ම සැලකිය යුතු ආර්ථික පාඩු ද ඇති කරයි. එපමණක් නොව, බෝ නොවන රෝග ලොව පුරා සිදුවන මරණ වලට ප්‍රධානතම හේතුවක් වන අතර, ශ්‍රී ලංකාවේ සිදුවන මරණ වලින් 83% ක් පමණ බෝ නොවන රෝග නිසා සිදුවේ. දුම්කොළ භාවිතය බෝ නොවන රෝග සඳහා ප්‍රධාන අවදානම් සාධක හතරෙන් එකක් ලෙස හඳුනාගෙන ඇති අතර එය රටේ සෞඛ්‍ය සේවාවට තවදුරටත් බරක් වේ.

දුම්පානයේ ආර්ථික බලපෑම විශාල ය. ශ්‍රී ලාංකිකයන් දිනකට රුපියල් මිලියන 520 ක් පමණ සිගරට් සඳහා වියදම් කරන අතර, පුද්ගලයන්, පවුල් සහ ප්‍රජාවන් අත්විඳින මූල්‍ය දුෂ්කරතා එය තවදුරටත් තීව්‍ර කරයි. ආහාර සහ අධ්‍යාපනය වැනි අත්‍යවශ්‍ය අවශ්‍යතා සඳහා වන වියදම් හීන කිරීමෙන්, පවුල් දරිද්‍රතාවයට තල්ලු කරන දුම්කොළ භාවිතය පවුල් වලට අහිතකර ලෙස බලපාන සාධකයන් වී ඇත. 2019 දී සිගරට් බදු ආදායම රුපියල් බිලියන 92.9 ක් වූ අතර, දුම්පානය හේතුවෙන් වන සෞඛ්‍ය හා ආර්ථික පිරිවැය රුපියල් බිලියන 214 ක් වූ අතර එය සිගරට් සුරාබදු බද්දෙන් උපයන ආදායමට වඩා සැලකිය යුතු ලෙස වැඩි විය. (The Case for Investing in WHO FCTC Implementation in Sri Lanka - 2019).


පාරිසරික වශයෙන්, දුම්කොළවල බලපෑම ඉමහත් ය. සෑම දිනකම, ශ්‍රී ලංකාවේ ප්ලාස්ටික් සිගරට් ෆිල්ටර් මිලියන 4.9 ක් පමණ (වසරකට බිලියන 1.8) ඉවත දමන අතර, මෙමගින් විෂ සහිත රසායනික ද්‍රව්‍ය 7,000 කට වඩා ගොඩබිම් සහ සමුද්‍ර පරිසර පද්ධතිවලට මුදා හරිනු ලැබේ. මෙම පරිසර දූෂණය ජෛව විවිධත්වයට දැඩි තර්ජනයක් එල්ල කරයි.

ශ්‍රී ලංකාවේ දුම්කොළ පාලනය පිළිබඳ ප්‍රගතියක් වසර ගණනාවක් පුරා දක්නට ලැබේ. මෙම තත්ත්වය විශේෂයෙන්ම දුම්කොළ භාවිතය අවම කිරීමට දිවයිනේ සෑම පළාතකම සිදු වූ ප්‍රජා මැදිහත් වීම් සහ දුම්කොළ සමාගම්වල උපක්‍රම හෙළි කිරීමත් ඊට විරුද්ධ ප්‍රජා බලයක් ක්‍රියාත්මක වීමත් දැක්විය හැකිය

මෙයට අමතරව 2006 දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (NATA) පනත පිහිටුවීම මෙන්ම 2003 දී ලෝක සෞඛ්‍ය සංවිධානයේ දුම්කොළ භාවිතය වැළැක්වීම සඳහා ඇති ප්‍රතිපත්ති රාමුවට (WHO Framework Convention on Tobacco Control - FCTC) අත්සන් තැබීම අප රටේ දුම්කොළ පාලනයට දායක වී ඇත. නමුත්, දුම්කොළ සමාගම්වල මැදිහත්වීම් හේතුවෙන් ස්ථාපිත ප්‍රතිපත්ති, විශේෂයෙන් බදුකරණය සම්බන්ධ ප්‍රතිපත්ති, ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම අභියෝගයක් වී ඇත. සිගරට් බදු ඉහළ ගොස් ඇතත්, දුම්කොළ සමාගම් අසමානුපාතිකව අතිවිශාල ලෙස ලාභ උපයමින් සිටී. උදාහරණයක් ලෙස, වෙළඳපොළ තුළ වැඩිම අලෙවියක් ඇති සිගරට් කාණ්ඩයේ සුරාබදු වැඩි වී තිබෙන්නේ රුපියල් 4.51කිනි.

නමුත් එහි මිල රුපියල් 10 කින් වැඩි වී ඇත. මෙමගින් සිගරට් සමාගම ලාභයෙන් වැඩි කොටසක් ඔවුන් සතු කරගෙන ඇත. නිවැරදි බදු අය කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කර නොමැති නිසා 2024 දී රජයේ සිගරට් බදු ආදායම රුපියල් බිලියන 6 කින් පහත වැටී ඇත. Verite Research ආයතනයට අනුව, සිගරට් සඳහා බදු මිල අනුපාතය වසර 15ක් තුළ එහි අවම මට්ටමට වැටී ඇති අතර එය දැනට 67% - 69% අතර වේ. මෙය ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශිත සිගරට් මිලෙන් බදු ප්‍රතිශතය 75% වු ප්‍රතිශත මට්ටමට වඩා අඩු මට්ටමක ඇති බව පැහැදිලිය.

පසුගිය දශකය තුළ ශ්‍රී ලංකාවේ සිගරට් අලෙවිය 54% කින් පහත වැටී ඇත. කෙසේ වෙතත්, එම කාලය තුළ ලංකා දුම්කොළ සමාගමේ බදු ගෙවීමෙන් පසු ලාභය 179% කින් ඉහළ ගොස් ඇත. මෙම තත්ත්වය පහත වගුවෙන් මනාව පැහැදැලි වේ.




විද්‍යාත්මක බදු ප්‍රතිපත්තියක් නොමැති වීම නිසා මිනිසුන්ට හානිදායක භාණ්ඩ නිෂ්පාදනය කරන ආයතන අනිසි ලෙස ලාභ උපයන ආකාරය මෙයින් ඉස්මතු කරයි. වත්මන් සිගරට් බදුකරණ ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමේ හදිසි අවශ්‍යතාවය ද මෙමගින් පැහැදිලි වේ.

පවතින අභියෝගවලට මුහුණ දීම සඳහා, මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය පහත දැක්වෙන බහු-පාර්ශ්වික යෝජනා ඉදිරිපත් කර සිටියි.

- සිගරට් සඳහා ක්‍රමානුකූල සහ විද්‍යාත්මක බදු ප්‍රතිපත්ති රාමුවක් හඳුන්වා දීම.
- එක දෙක වශයෙන් සිගරට් අලෙවිය තහනම් කිරීම.
- 2010 න් පසු උපන් පුද්ගලයින්ට දුම්කොළ නිෂ්පාදන විකිණීම තහනම් කිරීම සඳහා "දුම්කොළ වලින් නිදහස් පරම්පරාවක්" යන සංකල්පය ස්ථාපිත කිරීම.
- අධ්‍යාපන ආයතනයක සිට මීටර් 100ක් ඇතුළත දුම්වැටි අලෙවිය තහනම් කිරීම.
- දුම්කොළ නිෂ්පාදනවල හානිය සහ දුම්කොළ කර්මාන්තය විසින් භාවිතා කරන කූට උපක්‍රම පිළිබඳව දරුවන් දැනුවත් කිරීම සඳහා ජාතික මට්ටමේ පාසල් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- වෙළඳපොළේ විකිණීමට තහනම් කර ඇති සියලුම විද්‍යුත් සිගරට් වර්ග අත්අඩංගුවට ගැනීම සහ 2006 අංක 27 දරන දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනතේ 2016 සංශෝධනය උල්ලංඝනය වන අවස්ථාවලට නිශ්චිත දඬුවම් හඳුන්වා දීම.
- සම්මත ඇසුරුම්කරණය (plain packaging) හඳුන්වා දීම.
- සිගරට් පිල්ටර් තහනම් කිරීම.
- අන්තර්ජාලය හරහා දුම්කොළ නිෂ්පාදන විකිණීම තහනම් කිරීම.
- දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනත නිසිලෙස බලාත්මක කිරීම, ශක්තිමත් කිරීම සහ එහි යෝජනා කර ඇති සංශෝධන ගෙන ඒම.

දුම්කොළ කර්මාන්තයේ මැදිහත්වීම් වලින් දරුවන්, තරුණ තරුණියන් සහ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් ආරක්ෂා කිරීම සඳහා රජය, සෞඛ්‍ය අංශ, සිවිල් සමාජය, පාසල්, මහජනතාව වැනි සමාජයේ සියලුම අංශවල සහභාගීත්වය අත්‍යවශ්‍ය වේ. දුම්කොළ පාලන ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම, මහජන දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සහ දුම්කොළ කර්මාන්ත වල මැදිහත්වීම් වලට එරෙහි වීම ශ්‍රී ලංකාවේ දුම්කොළ ආශ්‍රිත හානිය අවම කිරීම සඳහා අත්‍යවශ්‍ය පියවර වේ. දුම්කොළ සමාගම් විසින් භාවිතා කරන කූඨ උපක්‍රම හඳුනාගෙන, ඒවාට අභියෝග කිරීමට මහජනතාව බලගැන්විය යුතුය. සියල්ල සලකා බැලූ විට, දුම්කොළ සමාගම් සිය නිෂ්පාදන තුළින් සහ උපක්‍රම තුළින් පුද්ගලයන්ට සහ ප්‍රජාවන්ට ඇති කරන හානියට එම සමාගම් වගකිව යුතු වේ.

**මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය**